**නිපුණතාව 12 : - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**

**නිපුණතා මට්ටම 12.1 : - සිමාසහිත සමාගමක් ආශ්‍රිතව ඇති නෛතික පසුබිම විමසා බලයි.**

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමක් අරමුදල් රැස් කර ගැනීමට සමාගමේ කොටස් මහජනතාවට නිකුත් කරයි.එලෙස කොටස් නිකුත් කර ලබා ගන්නා ප්‍රාග්ධනය **ප්‍රකාශිත ප්‍රාග්ධනය** වේ.

සමාගම් පනතේ 58 වගන්තියට අනුව " කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් සහ කොටස් මත වූ ඇරයුම සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හා ලැබිය යුතු සියලු මුදල්වල එකතුව" **ප්‍රකාශිත ප්‍රාග්ධනය** වේ.

### ක්‍රියාකාරකම 01

සීමා සහිත නිලූකා සමාගම සංස්ථාපනය කළ වහාම සාමාන්‍ය කොටස් 50000 ක් කොටසක් රු.18 බැගින් නිකුත් කර මුදල් ලබා ගන්නා ලදී.සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය කොපමණ ද?

### ක්‍රියාකාරකම 0

සීමා සහිත ඡානක සමාගම සාමාන්‍ය කොටස් 80000 ක් පහත සඳහන් පරිදි මුදල් ලබා ගැනීම සඳහා නිකුත් කරඇත.

අයඳුමේදී කොටසකට රු.12

ඇරයුමේ දී කොටසකට රු .8

ඇරයුම කැඳවා ඇත.සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය ගණනය කරන්න.